Uva Wellassa University

# ජාතික සංවර්ධනයට සාඩම්බර ලෙස දායකත්වය

# ඇබෑර්තු - අධ්‍යයන / අනධ්‍යයන

## කළමනාකරණ පීඨය - ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

කළමනාකරණ පීඨයේ පවතින අධ්‍යයන සහ අනධ්‍යයන තනතුරු ඇබෑර්තු සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් පහත පරිදි වේ.

**කළමනාකරණ පීඨය**

### 01. කළමනාකරණ විද්‍යා දෙපාර්තමේන්තුව

**තනතුර : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණිය I / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණිය II / කථිකාචාර්ය (ස්ථිර නොවන) / කථිකාචාර්ය (පරිවාස)**

**විෂය ක්ෂේත්‍රය :** 01. මානව සම්පත් කළමනාකරණය

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ BSc/ BBM (ගෞරව) උපාධියක් හෝ ව්‍යවසායකත්වය සහ කළමනාකරණය පිළිබඳ BBM (ගෞරව) උපාධියක් සමග අවශ්‍ය ශාස්ත්‍රීය/ පර්යේෂණ/ වෘත්තීය පළපුරුද්ද සහිත විය යුතුය.

**විශේෂ සටහන :** උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි මට්ටම්වලදී පහත සඳහන් පාඨමාලා ඒකක අතරින් අවම වශයෙන් තුනක් (03) ඉගැන්විය හැකි අය සඳහා ප්‍රමුඛතාවය හිමි වේ.

මානව සම්පත් කළමනාකරණය, උපාය මාර්ගික මානව සම්පත් කළමනාකරණය, ගෝලීය මානව සම්පත් කළමනාකරණය සහ නායකත්වය, කාර්මික සබඳතා සහ කම්කරු නීතිය.

**විෂය ක්ෂේත්‍රය 02 :** ව්‍යාපාරික ආර්ථික විද්‍යාව/ ආර්ථික විද්‍යාව

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් ව්‍යාපාරික ආර්ථික විද්‍යාව පිළිබඳ BSC (ගෞරව) උපාධියක් හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ BA (ගෞරව) උපාධියක් සමග අවශ්‍ය ශාස්ත්‍රීය/ පර්යේෂණ/ වෘත්තීය පළපුරුද්ද සහිත විය යුතුය.

**විශේෂ සටහන :** උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි මට්ටම්වලදී පහත සඳහන් පාඨමාලා ඒකක අතරින් අවම වශයෙන් තුනක් (03) ඉගැන්විය හැකි අය සඳහා ප්‍රමුඛතාවය හිමි වේ.

ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව, සාර්ව ආර්ථික විද්‍යාව, ව්‍යාපාරික ගණිතය, ජාත්‍යන්තර වෙළඳාම, සහ මූල්‍ය, ව්‍යාපාරික සංඛ්‍යානය

**විෂය ක්ෂේත්‍රය 03 :** අලෙවිකරණ කළමනාකරණය

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ BSc/ BBM (ගෞරව) උපාධියක් හෝ ව්‍යවසායකත්වය සහ කළමනාකරණය පිළිබඳ BBM (ගෞරව) උපාධියක් සමග අවශ්‍ය ශාස්ත්‍රීය/ පර්යේෂණ/ වෘත්තීය පළපුරුද්ද සහිත විය යුතුය.

**විශේෂ සටහන :** උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි මට්ටම්වලදී පහත සඳහන් පාඨමාලා ඒකක අතරින් අවම වශයෙන් තුනක් (03) ඉගැන්විය හැකි අය සඳහා ප්‍රමුඛතාවය හිමි වේ.

විකුණුම් කළමනාකරණය, වෙළඳ දැන්වීම් සහ නියෝජිතායතන කළමනාකරණය, වෙළඳ භාණ්ඩකරණ (Merchandising) කළමනාකරණය, ජාත්‍යන්තර ව්‍යාපාරික අලෙවිකරණය, පාරිභෝගික හැසිරීම් සහ සම්බන්ධතා කළමනාකරණය

**විෂය ක්ෂේත්‍රය 04 :** මෙහෙයුම් කළමනාකරණය

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් මෙහෙයුම් සහ තාක්ෂණ කළමනාකරණය පිළිබඳ BSc (ගෞරව) උපාධියක් හෝ මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ BBA (ගෞරව) උපාධියක් සමග අවශ්‍ය ශාස්ත්‍රීය/ පර්යේෂණ/ වෘත්තීය පළපුරුද්ද සහිත විය යුතුය.

**විශේෂ සටහන :** උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි මට්ටම්වලදී පහත සඳහන් පාඨමාලා ඒකක අතරින් අවම වශයෙන් තුනක් (03) ඉගැන්විය හැකි අය සඳහා ප්‍රමුඛතාවය හිමිවේ.

නිෂ්පාදන සහ මෙහෙයුම් කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය, දැනුම් කළමනාකරණය, මෙහෙයුම් පර්යේෂණ.

### 02. රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව

**තනතුර : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණිය I / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණිය II / කථිකාචාර්ය (ස්ථිර නොවන) / කථිකාචාර්ය (පරිවාස)**

**විෂය ක්ෂේත්‍රය 01 :** මානව සම්පත් සංවර්ධනය

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් මානව සම්පත් සංවර්ධනය පිළිබඳ BBM/ BBA/BA/BSc (ගෞරව) උපාධි සහිත විය යුතුය.

**විෂය ක්ෂේත්‍රය 02 :** ඉගෙනීම/ පුහුණුව සහ සංවර්ධනය

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් මානව සම්පත් සංවර්ධනය පිළිබඳ BBM/ BBA/BA/BSc (ගෞරව) උපාධි සහිත විය යුතුය..

**විෂය ක්ෂේත්‍රය 03 :** ව්‍යාපාර අධ්‍යයනය/ කළමනාකරණය

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් මානව සම්පත් සංවර්ධනය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර අධ්‍යයනය හෝ කළමනාකරණය පිළිබඳ BBM/BBA/BA/BSc (ගෞරව) හෝ ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් සහිත විය යුතුය.

**විෂය ක්ෂේත්‍රය 04 :** මානව සම්පත් හා ව්‍යාපාර විශ්ලේෂණ

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් මානව සම්පත් සංවර්ධනය/ ව්‍යාපාර විශ්ලේෂණය/ මෙහෙයුම් සහ තාක්ෂණ කළමනාකරණය/ තීරණ ගැනීමේ විද්‍යාව පිළිබඳ BBM/BBA/BA/BSC (ගෞරව) හෝ ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් සහිත විය යුතුය.

### 03. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව

**තනතුර : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණිය I / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණිය II / කථිකාචාර්ය (ස්ථිර නොවන) / කථිකාචාර්ය (පරිවාස)**

**විෂය ක්ෂේත්‍රය :** 01. ඥානවිද්‍යාවන් සහ මූල න්‍යායික අධ්‍යයනයන්

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ BA (ගෞරව) උපාධියක් සමග අදාළ පශ්චාත් උපාධියක් (Masters Degree) සහ සෘජුවම අදාළ වන වෙනත් වෘත්තීය සුදුසුකමක් සහිත විය යුතුය. TESL හෝ සාහිත්‍ය උපාධිධාරීන් මෙම කාණ්ඩය යටතේ සලකා බලනු නොලැබේ.

**විශේෂ සටහන :** මෙටා සංජානන විචාරාත්මක (Meta-Cognitive-Discursive) ආකෘතීන් පිළිබඳ ඉගැන්වීමේ සහ පළපුරුද්ද විදහා දැක්විය හැකි, භාෂා අධ්‍යයනය පිළිබඳ මූල න්‍යායික ප්‍රවේශයන් පිළිබඳ විශේෂ: දැනුමක් ඇති භාෂා සහ පර්යේෂණ ක්ෂේත්‍රයේ විවේචනාත්මක ඥානවිද්‍යාවන් කෙරෙහි උනන්දුවක් දක්වන ජෛව භාෂා විද්‍යාව පිළිබඳ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමි වේ. BA (ගෞරව) ඉංග්‍රීසි භාෂාව සහ ව්‍යාවහාරක භාෂා විද්‍යාව අධ්‍යයන වැඩසටහන් සඳහා ඉගැන්වීමේ පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ට ද ප්‍රමුඛතාවය හිමි වේ..

**විෂය ක්ෂේත්‍රය 02 :** ඉංග්‍රීසි භාෂාවේ අන්තර් භාෂාමය ආකෘතිකරණය

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ BA (ගෞරව) උපාධියක් සමග අදාළ පශ්චාත් උපාධියක් (Master's Degree) සහ වෙනත් ඕනෑම අදාළ වෘත්තීය සුදුසුකමක් සහිත විය යුතුය. TESL හෝ පරිවර්තන උපාධිධාරීන් මෙම කාණ්ඩය යටතේ සලකා බලනු නොලැබේ.

**විශේෂ සටහන :** ICT හැකියාව සහිත, භාෂා විද්‍යාව පිළිබඳ පර්යේෂණ ක්‍රමවේද සහ කෝපස් අධ්‍යයන්හි දී (Corpus Studies) නවීන තාක්ෂණය භාවිතා කිරීමට දක්ෂතාවයක් දක්වන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමි වේ. BA (ගෞරව) ඉංග්‍රීසි භාෂාව සහ ව්‍යවහාරික භාෂා විද්‍යාව අධ්‍යයන වැඩසටහන් සඳහා ඉගැන්වීමේ පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ට ද ප්‍රමුඛතාවය හිමි වේ.

### 04. සංචාරක අධ්‍යයන දෙපාර්තමේන්තුව

**තනතුර : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණිය I / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණිය II / කථිකාචාර්ය (ස්ථිර නොවන) / කථිකාචාර්ය (පරිවාස)**

**විෂය ක්ෂේත්‍රය 01 :** සත්කාරක සේවා කළමනාකරණය – සූපවේදය සහ ආහාර පාන කළමනාකරණය.

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් සත්කාරක සේවා සහ සංචාරක කළමනාකරණය පිළිබඳ BBM/BSc (ගෞරව) උපාධියක් සහ ඒ හා සම්බන්ධ අනෙකුත් සුදුසුකම් සහිත විය යුතුය.

**විශේෂ සටහන :** අදාළ කර්මාන්ත ක්ෂේත්‍රයේ වෘත්තීය පළපුරුද්ද සහිත අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමි වේ.

**විෂය ක්ෂේත්‍රය 02 :** සත්කාරක සේවා කළමනාකරණය – නවාතැන්/ කාමර අංශ කළමනාකරණය

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් සත්කාරක සේවා සහ සංචාරක කළමනාකරණය පිළිබඳ BBM/BSC (ගෞරව) උපාධියක් සහ ඒ හා සම්බන්ධ අනෙකුත් සුදුසුකම් සහිත විය යුතුය.

**විශේෂ සටහන :** අදාළ කර්මාන්ත ක්ෂේත්‍රයේ වෘත්තීය පළපුරුද්ද සහිත අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමි වේ.

**විෂය ක්ෂේත්‍රය 03 :** සංචාරක සහ ගුවන් සේවා කළමනාකරණය

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් සත්කාරක සේවා සහ සංචාරක කළමනාකරණය පිළිබඳ BBM/BSc (ගෞරව) උපාධියක් සහ ඒ හා සම්බන්ධ අනෙකුත් සුදුසුකම් සහිත විය යුතුය.

**විශේෂ සටහන :** අදාළ කර්මාන්ත ක්ෂේත්‍රයේ වෘත්තීය පළපුරුද්ද සහිත අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමිවේ.

**විෂය ක්ෂේත්‍රය 04 :** උත්සව කළමනාකරණය (Events Management)

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් සත්කාරක සේවා, සංචාරක සහ උත්සව කළමනාකරණය පිළිබඳ BBM (ගෞරව) උපාධියක් සහ ඒ හා සම්බන්ධ අනෙකුත් සුදුසුකම් සහිත විය යුතුය.

**විශේෂ සටහන :** අදාළ කර්මාන්ත ක්ෂේත්‍රයේ වෘත්තීය පළපුරුද්ද සහිත අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමි වේ.

**විෂය ක්ෂේත්‍රය 05 :** සත්කාරක කළමනාකරණය

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් සත්කාරක සේවා, සංචාරක හා උත්සව කළමනාකරණය පිළිබඳ BBM (ගෞරව) උපාධියක් සහ ඒ හා සම්බන්ධ අනෙකුත් සුදුසුකමක් සහිත විය යුතුය.

**විශේෂ සටහන :** මානව සම්පත් කළමනාකරණය/ අලෙවිකරණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් සහ අදාළ කර්මාන්ත ක්ෂේත්‍රයේ අදාළ පළපුරුද්ද සහිත අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමි වේ.

**විෂය ක්ෂේත්‍රය 06 :** ධරණීය සංවර්ධනය

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් පරිසර විද්‍යාව සහ ස්වභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ BSc (ගෞරව) උපාධියක් සහ ඒ හා සම්බන්ධ අනෙකුත් සුදුසුකම් සහිත විය යුතුය

**විෂය ක්ෂේත්‍රය 07 :** ජර්මන් සහ ඉංග්‍රීසි භාෂාව

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් ජර්මන් භාෂාව පිළිබඳ BA (ගෞරව) උපාධියක් සමග ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL) අතිරේක විෂයක් ලෙස හදාරා තිබීම සහ ඒ හා සම්බන්ධ අනෙකුත් සුදුසුකම් සහිත විය යුතුය.

**විශේෂ සටහන :** වෘත්තීය පළපුරුද්ද සහ ජර්මන් භාෂාව පිළිබඳ CEFR, C1 මට්ටමේ නිපුණතාවයක් ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමි වේ.

**විෂය ක්ෂේත්‍රය 08 :** ආර්ථික විද්‍යාව සහ ව්‍යවහාරික ආර්ථික මිනුම් විද්‍යාව.

**අධ්‍යාපන සුදුසුකම් :** අයදුම්කරුවන් ආර්ථික විද්‍යාව පිළිබඳ BA (ගෞරව) උපාධියක් සහ ඒ හා සම්බන්ධ අනෙකුත් සුදුසුකම් සහිත විය යුතුය. ව්‍යවහාරික ආර්ථික මිනුම් විද්‍යාව, ව්‍යාපාරික ගණිතය, ව්‍යාපාරික සංඛ්‍යානය, දත්ත විශ්ලේෂණය, පාරිසරික ආර්ථික විද්‍යාව හෝ ඒ හා සම්බන්ධ අන්තර් විෂය පර්යේෂණ පිළිබඳ අතිරේක විශේෂඥතාවක් තිබීම අමතර වාසියක් වනු ඇත.

**විශේෂ සටහන :** අදාළ ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමි වේ.

### තාක්ෂණ නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) ශ්‍රේණිය III

**සුදුසුකම් :**

අ.පො.ස. (උ/පෙ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් එක් වාරයකදී විෂයන් තුනකින් (3) සමත්ව තිබීම.

සහ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පාර්ලිමේන්තු පනතකින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකින් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ/ ඉලෙක්ට්‍රොනික/ බහුමාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ NVQ මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකක් ලබා තිබීම.

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉහත (ii) (a) සුදුසුකමට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ/ ඉලෙක්ට්‍රොනික/ බහුමාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සුදුසුකමක් ලබා තිබීම සමග පිළිගත් සංවිධානයක ශව්‍ය දෘශ්‍ය වැඩ පිළිබඳ වසර එකක පළපුරුද්ද.

**තෝරාගැනීමේ ක්‍රම වේදය :**

ලිඛිත සහ /හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වැටුප් පරිමාණය :**

UMT 1 : (III) රු. 51,095-7X540 : 10X640 - 60,575/- මසකට

**වයස :**

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැඩිදුර සටහන :**

අදාළ අවශ්‍යතාවයන්ට ගැළපෙන විශේෂඥතාවයක් සහිත අයදුම්කරුවන් UGC චක්‍රලේඛ අංක 721, 996, 08/2016 සහ 07/2018 පරිශීලනය කරන ලෙස හෝ www.ugc.ac.lk වෙබ් අඩවියට පිවිසෙන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

අදාළ චක්‍රලේඛයන්හි දක්වා ඇති පරිදි පශ්චාත් උපාධියයක් ලබා තිබීම කථිකාචාර්ය (ස්ථිර නොවන) සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (ශ්‍රේණිය I/II) තනතුර සඳහා අත්‍යවශ්‍ය සුදුසුකමකි.

### වේතන සහ ප්‍රතිලාභ

**වැටුප් පරිමාණයන්**

- කථිකාචාර්ය (පරිවාස) - [U-AC 3 (IV)]
  රු. 94,400 - 10 X 2,400 - 118,400 මසකට
- කථිකාචාර්ය (ස්ථිර නොවන) - [U - AC3 (III)]
  රු. 121,340 - 5 X 2,940 - 136,040 මසකට
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (ශ්‍රේණිය II) - [U-AC 3 (II)]
  රු. 138,980 - 11 X 2,940 - 171,320 මසකට
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (ශ්‍රේණිය I) - [U-AC 3 (I)]
  රු. 160,520 - 7 X 3,900 - 187,820 මසකට

මීට අමතරව, විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සහතික පිටපත් (පිටපත්) සමග, 2026-05-26 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, මානව සම්පත් අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, පස්සර පාර, බදුල්ල ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

කවරයෙහි ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්පත් ආකෘති පත්‍ර, අභිමත සුදුසුකම් සහ වෙනත් අදාළ තොරතුරු විශ්වවිද්‍යාල වෙබ් අඩවිය වන www.uwu.ac.lk වෙත පිවිසීමෙන් ලබාගත හැක.

තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම් කරනු ලබන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා වෙන් වෙන්ව, වෙන් වෙන් කවර මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. වඩාත් කැමති විෂය ක්ෂේත්‍රය අයදුම්පත් පෝරමයේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

විශ්වවිද්‍යාල පද්ධතිය / රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල හි සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතුය. නිසි මාර්ගයෙන් නොලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

අසම්පූර්ණ අයදුම්පත්, සහායක ලිපිලේඛන රහිත අයදුම්පත් සහ අවසන් දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ. අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමේ සහ එම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ.

**වැඩ බලන ලේඛකාධිකාරී,**
**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය,**
**පස්සර පාර, බදුල්ල.**
**2026.04.27**